**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date | 2016-08-10 |
|---|---|---|---|

පැමිණිලිකරුවන් : 1. සී.එච්.එදිරිමාන්න මහතා,
නො. 51/ආර්, දියවන්නා උද්‍යානය,
පැලවත්ත, බත්තරමුල්ල.

2. ප්‍රසන්න මාපා විජේසිංහ මයා,
නො. 98, පරණ කොට්ටාව පාර,
මිරිහාන, නුගේගොඩ.

වගඋත්තරකරුවන් : 1. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

2. අධ්‍යක්ෂ (ජාතික පාසැල්),
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

3. විදුහල්පති,
නාලන්දා විද්‍යාලය,
කොළඹ 10.

<u>පැමිණිලි අංක</u> : **<u>HRC/3358/15/L – 15, HRC/4706/15/L– 15</u>**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ තම දරුවන් 2015 වර්ෂයේ නාලන්දා විද්‍යාලයෙහි පළමු ශ්‍රේණියට ආදි ශිෂ්‍ය පදනම මත ඇතුලත් කිරීමට අයදුම් කරන ලදුව පොරොත්තු ලේඛනයේ 03 සහ 04 ස්ථානයන් හි ස්ථාන ගත වී ඇති බවයි. මෙසේ තිබියදී පොරොත්තු ලේඛනයේ 06 වන ස්ථානයේ ස්ථානගත වී ඇති දරුවා පාසලට ඇතුලත් කොට ඇති බවත්, ඒ කුමන පදනමක් මත ද යන්න නොදන්නා බවත්, තමන්ට වඩා අඩු සුදුසුකම් සහිත දරුවන් පාසැලට ඇතුලත් කිරීමට වගඋත්තරකරු විසින් කටයුතු කිරීම හේතුවෙන් සිය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත් සඳහන් කර ඇත.




| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 165,කිංසි පාර, කොළඹ - 08.<br>165, கின்சி வீதி, கொழும்பு - 08.<br>165, Kynsey Road, Colombo - 08. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 011-2696470 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2696470 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrc@sltnet.lk |
|---|---|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94 - 11 - 2694925, 2685980, 2685981 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2689558 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 011-2689558, 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |

ඒ අනුව සිදුවූ අසාධාරණය සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා වගඋත්තරකාර විද්‍යාලයට තම දරුවන් දෙදෙනා ඇතුළත් කිරීම මෙම පැමිණිල්ලෙන් අපේක්ෂා කරන බවද සඳහන් කර ඇත.

වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-

උක්ත අංක දරණ පැමිණිල්ල සබැඳිව පැමිණිලිකාර සහ වගඋත්තරකාර යන පාර්ශවයන්ගේ සහභාගිත්වයෙන් 2016.02.01 හා 2016.03.21 දින මානව හිමිකම් කොමිෂන් සභාවෙහිදී පරීක්ෂණ කටයුතු පවත්වා ඇති අතර, වගඋත්තර පාර්ශවය විසින් සිය ස්ථාවරය මෙලෙසින් ගෙන හැර දක්වා ඇත.

ආදි ශිෂ්‍ය ගණය යටතේ 2015 වර්ෂයේ මෙම විද්‍යාලයට ඇතුළත් කළ හැකි ශිෂ්‍ය සංඛ්‍යාව 42 වන අතර, ආදි ශිෂ්‍ය සංගමයේ එකගත්වය පරිදි 23/2013 චක්‍ර ලේඛ උපදෙස් ප්‍රකාරව සකසන ලද ලකුණු නිර්ණායක අනුව සම්මුඛ පරීක්ෂණ සිදුකර අදාළ ශිෂ්‍ය සංඛ්‍යාව තෝරාගෙන ඇති බවත්, අවම කඩඉම් ලකුණු සීමාව 42.5 වන බවත් 10 දෙනෙකුගෙන් සමන්විත පොරොත්තු ලේඛනයේ අවම ලකුණු මට්ටම ලකුණු 42 ක් වූ අතර, ඇති වූ පුරප්පාඩු 02 ක් හේතුවෙන් 23/2013 චක්‍රලේඛයේ උපදෙස් පරිදි එම ලේඛනයේ 1 හා 2 දරුවන්ට අවස්ථාව ලබාදී ඇති බවත් සඳහන් කර ඇත.

තවද 2015 වර්ෂයේදී පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීම සඳහා විශේෂ අභියාචනා කමිටුවක් අධ්‍යාපන අමාත්‍යංශය මගින් පත් කර ඇති බවත්, 23/2013 චක්‍රලේඛයේ 11 : 10 වගන්තිය ප්‍රකාරව මෙම විශේෂ අභියාචනා කමිටුව ක්‍රියාත්මක වූ අතර, පාසැල නියෝජනය කිරීම සඳහා විදුහල්පති සහ නියෝජ්‍ය විදුහල්පති ද සහභාගිවී ඇති බවත්, මෙම අභියාචනා කමිටුවට පැමිණිලිකරුවන් අභියෝග කරන පොරොත්තු ලේඛනයේ 06 වන දරුවා වෙනුවෙන් අභියාචනයක් කර ඇති බවත් සඳහන් කර ඇත.

ආදි ශිෂ්‍ය ගණය යටතේ පොරොත්තු ලේඛනයේ තුන්වැනියාගේ සිට ඉතිරි වී සිටි අය අතරින් (පැමිණිලිකරුවන් ද සමග) ජ්.අයි. ගම්මන්පිල යන දරුවාගේ ලකුණු පමණක් සංශෝධනය වී තිබූ බවද පොරොත්තු ලේඛනයේ 06 වෙනියාගේ ලකුණු මෙලෙස සංශෝධනය වූ අතර, පුරප්පාඩු ඇත්නම් ඔහු ඇතුළත් කර ගන්නා ලෙස අධ්‍යාපන ලේකම්වරයා දැනුම්දී ඇති බවද සඳහන් කර ඇත. මේ අනුව චක්‍රලේඛයේ 11 : 10 ප්‍රකාරව අධ්‍යාපන ලේකම්වරයාගේ නියෝගය අනුව අදාළ දරුවාට ලකුණු 4 ක් එකතු කර පාසලට ඇතුළත් කර ඇත. කෙසේ වෙතත් එකී දරුවාට ලකුණු 4 ක් එකතු කිරීමේ පදනම පෙන්වා දීමට වගඋත්තරකරුවන් අපොහොසත් වී ඇත.

නිරීක්ෂණ හා නිගමනය :-

පොරොත්තු ලේඛනයේ 06 වන දරුවාගේ අභියාචනය සලකා බලා ලකුණු සංශෝධනය වීම මත විද්‍යාලය වෙත ඇතුළත් කර ඇත. පොරොත්තු ලේඛනයේ 1 හා 2 සිසුන්, ඇති වූ පුරප්පාඩු මත

23/2013 චක්‍රලේඛය ප්‍රකාරව විද්‍යාලය වෙත ඇතුළත් කර ඇති අතර. පොරොත්තු ලේඛනයේ 3, 4 සහ 5 සිසුන් කෙරෙහි අවධානය යොමු නොකර අදාළ කමිටුව තීරණයකට එළඹීම අයුක්ති සහගත බැව් නිරීක්ෂණය වේ. එසේම පොරොත්තු ලේඛනයක් සකස් කොට තිබියදී එකී ලේඛනයේ අනුපිළිවෙළ නොසලකා ලේඛනයේ පහළින් සිටි දරුවෙකු පාසලට ඇතුළත් කර ගැනීමට පදනම් වූ හේතුවක් වගඋත්තරකරුවන් පෙන්වා දී නොමැත. පොරොත්තු ලේඛනය පිළියෙල කිරීමෙන් අනතුරුව පාසල විසින් ඇති වන පුරප්පාඩු සඳහා දරුවන් ඇතුළත් කළ යුත්තේ එකී ලේඛනයේ අනුපිළිවෙළ ප්‍රකාරවය. පොරොත්තු ලේඛනයේ අනුපිළිවෙළෙහි වෙනසක් සිදු කරන්නේ නම් එය කළ යුත්තේ ඉහළින් සිටින දරුවන්ගේ දෙමව්පියන්ටද කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා දීමෙන් අනතුරුවය.

මේ අනුව පැමිණිලිකරුවන්ට වඩා පොරොත්තු ලේඛනයේ පහළින් නම් සඳහන් දරුවෙකු පාසලට ඇතුළත් කර ගැනීම අත්තනෝමතික ක්‍රියාවක් වන අතර එතුළින් ඔවුනට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව මගින් සාක්ෂාත් කර ඇති නීතිය ඉදිරියේ සමානාත්මතාවය පිළිබඳ මූලික අයිතිය උල්ලංඝනය වී ඇති බව මෙම පරීක්ෂණයෙන් අනතුරුව තීරණය කරනු ලැබේ.

නිර්දේශය :-

> මේ අනුව පැමිණිලිකරුවන්ගේ දරුවන් වගඋත්තරකාර විද්‍යාලයේ සමාන්තර ශ්‍රේණියේ පන්තියකට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු බවට මෙයින් වගඋත්තර පාර්ශවය වෙත නිර්දේශ කරනු ලැබේ.

2016-09-01 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලි පාර්ශවය විසින් ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

B/ー

Dr. N. D. Udagama
Chairperson
Human Rights Commission of Sri Lanka